# වජ්ජ සංකල්පය : බෞද්ධ සූත්‍ර ධර්ම ඇසුරින් විමසා බැලීම

**පාතේගම ඤාණිස්සර හිමි**

වජ්ජ යන පාලි වචනයේ අදහස වන්නේ වරද යන්නයි. තුන් දොරින් කරනු ලබන සාවද්‍ය ක්‍රියා මෙලෙස හඳුන්වනු ලැබේ. මූලික වශයෙන් මිනිසා කරනු ලබන වැරදි කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. එනම්,

1. මිනිසා මිනිසාට එරෙහිව කරනු ලබන වැරදි
2. මිනිසා පොදු සමාජයට එරෙහිව කරනු ලබන වැරදි
3. මිනිසා පරිසරයට එරෙහිව කරනු ලබන වැරදි

යනුවෙන්ය.

බෞද්ධ සූත්‍ර ධර්මවල මෙම සංකල්පය දේශනාවේ ඇති ආකාරය විමසා බැලීම මේ ලිපියේ අරමුණයි. අංගුත්තර නිකායේ කාලාම සූත්‍රයෙහි[1] වරද හඳුනා ගන්නා ක්‍රම කිහිපයක් දක්වා තිබේ. එනම්;

1. හිත පිණිස අහිත පිණිස පවතින බව **(හිතායවා අහිතාය වා)**
2. කුසල අකුසලවලට අයිතිවීම **(ඉමේ ධම්මා කුසලා- ඉමේ ධම්මා අකුසලා)**
3. වරද සහිත සහ වරද රහිත බව **(ඉමේ ධම්මා සාවජ්ජා- ඉමේ ධම්ම අනවජ්ජා)**
4. විඤ්ඤූපසත්ථ සහ විඤ්ඤූගරහිත බව **(විඤ්ඤූපසත්ථා, විඤ්ඤූගරහිතා)**

5. අහිත පිණිස පැවතීම දුක් පිණිස පැවතීම **(අහිතාය දුක්ඛාය සංවත්තති)**

කාලාම සූත්‍රයෙහි දී වරද නිවරද තෝරා බේරා ගනු ලබන ක්‍රමවේදය මෙසේ දක්වා තිබේ. මෙම ඉගැන්වීම වෙනත් සූත්‍රවල ද දක්නට ලැබේ.[2]

තමා විසින් කරනු ලැබූ ක්‍රියාවකදී තමා කළ එම ක්‍රියාව තමාගේ අර්ථය **(හිතාය)** පිණිස පැවතුනා නම් එය යහපත් ක්‍රියාවකි. තමාගේ අනර්ථය පිණිස **(අහිතාය)** පැවතුනේ නම් එම ක්‍රියාව යහපත් ක්‍රියාවක් නො වේ. මේ ලෙස තමා ම නිශ්චය කරගනු ලබන හෝ තමාට ම විනිශ්චය කරගත හැකි විවෘත්ත ක්‍රමයක් බුදුසමයෙහි දක්වා තිබේ. ඒ අනුව විමසා බලා තීන්දු තීරණ ගත යුතු ය. තමා කරනු ලබන ක්‍රියාව තමාගේ ම අහිත පිණිස පවතින බව නො දැන ක්‍රියාවන්හි නිරත වන මිනිස්සු සිටිති. එම නිසා ම බුදුසමය උපදෙස් දෙනු ලබන්නේ යම් ක්‍රියාවක් කිරීමට ප්‍රථම එම ක්‍රියාවේ ප්‍රතිඵලය දෙස හිතා බලන ලෙස ය. යම් ක්‍රියාවක් කිරීමට ප්‍රථම එහි ප්‍රතිඵලය මෙබඳු යයි නිශ්චිතව ම කිව නො හැකි වුව ද අනුමාන වශයෙන් නිශ්චය කළ හැකිය. එම නිසා ක්‍රියාවක් කිරීමට ප්‍රථම එහි ප්‍රතිඵලය කෙබඳු වේ දැයි සිතා බැලිය යුතු ය. එහි ප්‍රතිඵලය ආස්වාද ජනක ලෙස විඳින්නට වන එකක් නම් එබඳු ක්‍රියා කරන්න.[3] කඳුළු පිරි මුහුණින් යුතු ව විඳින්නට සිදුවන එකක් නම් එබඳු ක්‍රියා කිරීමෙන් වළකින්න.[4]

තමා යම් ක්‍රියාවක් සිදු කරන විට එම ක්‍රියාව වරද සහිත ද වරද රහිත ද යනුවෙන් තෝරා බේරා ගැනීමට හැකි මිනුම් දණ්ඩක් වශයෙන් කුසල-අකුසල භේදය දැක්විය හැකි ය. යම් ක්‍රියාවක් කරන විට එම කායික හෝ වාචසික හෝ මානසික ක්‍රියාව කුසල් සඳහා හේතු වන්නේ ද අකුසල් සඳහා හේතු වන්නේ ද යන්න විමසා බැලිය යුතු වෙයි. තමා කරනු ලබන ක්‍රියාව අකුසලයක් නම් එය වරද සහිත වූවකි. එබඳු දෙය කිරීම සුදුසු නැත. සංසාරය දීර්ඝ වීමට අකුසලය හේතු වෙයි. අකුසල



යනු පුද්ගල මනසෙහි පවතින කෙලෙස් ය. සිත කිළිටි කරන නරක් කරන මාවත අකුසල පාක්ෂික චෛතසික ධර්මයෝ කෙලෙස් නම් වෙති.[5] කෙලෙස් සහිත ක්‍රියාව අකුසල් ය.

කෙලෙස් රහිත ක්‍රියාව කුසල් ය. **උපක්කිලෙස, කිලෙස, අංගන, චේතොඛිල ආසාව, ඕඝ, යෝග, නීවරණ,** ආදී විවිධ නම්වලින් සූත්‍රපිටකයේ කෙලෙස් හඳුන්වනු ලබයි. කෙලෙස් සහිත සිතින් පුද්ගලයා කරනු ලබන ක්‍රියා අකුසල් ය. තමා කරනු ලබන ක්‍රියාවක වරද නිවරද බව තෝරා ගැනීම සඳහා කුසල අකුසල ප්‍රභේදය මිනුම් දණ්ඩක් වශයෙන් භාවිත කළ හැකි වෙයි. මිනිසා කරනු ලබන ක්‍රියාව සාවද්‍යය ද අනවද්‍යය යනුවෙන් සොයා විමසා බැලීමේදී අංග දෙකක් සැලකිය යුතු වෙයි.

එනම්,

1. තමා කළ ක්‍රියාව පිළිබඳ තමාගේ ඇගයුම,
2. එම ක්‍රියාව පිළිබඳව සමාජයේ ඇගයුම වශයෙනි.

තමා තුළ තමා කරනු ලැබුවේ වරදක් බවට හැඟීමක් ඇති වීම සිදු වේ නම් එය වරදක් බව තමාට ම දැනෙන්නේ නැත. එයට හේතුව මිනිස් මනස ස්වාර්ථකාමී බව ඇසුරු කරන නිසා ය. සද්භාවයෙන් එය විමසා බැලිය යුතු ය. තමා කළ වරද සමාජ ගත වූ කල්හි සමාජය ද එය වරදක් වශයෙන් තීරණය කරනු ලබයි. එවිට මිනිස්සු එම ක්‍රියාවට එරෙහි ව නැගී සිටිති.[6] **(මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති)** එබඳු අවස්ථාවකදී සමාජයේ අදහස අනුව වරද නිවරද තීරණය වෙයි. සමාජයේ බොහෝ දෙනා වරදක් වශයෙන් හඳුන්වනු ලබන විට සමාජ මතය අනුව කටයුතු කිරීම සලකා බලා තීරණය කරනු ලබයි.[7]

නමුත් සෑම අවස්ථාවකදීම මහජන මතය අනුමත කිරීමක් බුදුසමයේ දක්නට නැත. නිදසුනක් වශයෙන් සංඝකර්ම දැක්විය හැකි ය. සංඝකර්මවලදී ඡන්දය විමසා බැලීම නිවැරදි ක්‍රමයයි. නමුත් මිථ්‍යා දෘෂ්ටියක් වැඩි ඡන්දවලින් මතු වන

අවස්ථාවක එම ඡන්දය අවලංගු කිරීමේ බලය මහ තෙරුන්හට තිබේ. එයට හේතුව වැරදි, ධර්ම විරෝධී, සත්‍ය විරෝධී යම් අදහසක් වැඩි ඡන්දවලින් හෝ වැඩි පිරිසකගේ අනුමතයෙන් සම්මත වන අවස්ථාවක එම මහතෙරවරුන්ගේ තීරණය අනුවකටයුතු කිරීමේ බලය තිබේ.[8] සමාජය වරද නිවරද ලෙස යමක් පිළිබඳ ව තීරණයකට පැමිණෙනු ලබන්නේ එම සමාජය තුළ පවතින සම්මත අනුව යි. සෑම සම්මතයක්ම නීතියක් ලෙස පිළිගත නො හැකි වුව ද නීතියක් නම් එය බොහෝවිට සමාජ සම්මතයකි. සමාජ සම්මත අනුව ද වරද නිවරද තීරණය කරනු ලබයි. සමාජයක සදාචාර සම්පන්න බව ආරක්‍ෂා වන්නේ සම්මතවලට අනුව නමුදු අධිකරණ වරද නිවරද තෝරා ගැනීම සඳහා සම්මත නීතිය ක්‍රමවේදයක් වශයෙන් සලකනු ලබයි.[9] ලිඛිත නීතියෙන් නො පවත්නා දෙයක් කිරීම නීති විරෝධී ක්‍රියාවක් ලෙස සලකනු ලබන්නේ නැත. නීතිය පනවා නැති කල්හි යම් වරදක් කළ හොත් එම සාවද්‍ය ක්‍රියාව මුලින්ම කළ පුද්ගලයා ආදිකම්මිකයා ලෙස සලකා නිදහස් කොට තිබේ.[10] <u>**(ආදිකම්මිකස්ස අනාපත්ති)**</u> යනුවෙන් දක්වා තිබෙන්නේ එයයි. අධිකරණයකට නො යන තරමේ වැරදි ද සමාජයක සිදුවිය හැකි ය. ඒවා සමාජ විරෝධි ක්‍රියාවන් ය. එබඳු වැරදි සඳහා දඬුවම් දෙනු ලබන්නේ සමාජය විසින් ය. නිදසුනක් ලෙස යම් සමාජයක පවතින සදාචාර සිරිත් නො සලකා කටයුතු කරන අවස්ථාවක් දැක්විය හැකිය. එබඳු අවස්ථාවලදී එම පුද්ගලයා සමාජයෙන් පිටමං කරනු ලබයි.[11]

ඇතැම් අවස්ථාවක කථා නො කර සිටීම, වරද සහිත සිද්ධීන් උපහාසයට ලක් කිරීම, එබඳු සිද්ධි නො කරන ලෙස අවවාද කිරීම ආදිය දැක්විය හැකි ය. එබඳු අවස්ථාවලදී ගැරහීම උදහසට ලක් වීම දැක්විය හැකි ය. **අලගද්දූපම**[12] සූත්‍රයෙහි දී අන්තරායකර ධර්ම ඇසුරු කළ විට අන්තරායකර නො වේ යයි අරිට්ඨ භික්‍ෂුව විසින් පිළිගෙන සමාජයට කී අවස්ථාව දැක්විය හැකි ය. එම අවස්ථාවේ බුදුහු උන්වහන්සේගේ වරදට ගරහන ලදී. "හිස් පුරුෂය, මා විසින් දෙසූ අන්තරායකර ධර්ම නො



දැන සිටින්නෙහි ද, හිස් පුරුෂය. මා විසින් නොයෙක් ආකාරයෙන් අන්තරාය කර ධර්ම අන්තරායකර යයි වදාරණ ලද්දාහු නොවෙති ද? සේවනය කරන්නාහුට ඒ ධර්ම අන්තරාය පිණිස සමත් නොවේ ද? මා විසින් කාමයෝ අල්පාස්වාද යයි වදාරණ ලද්දාහු නො වේද්ද? උගතුන් හා බුද්ධිමතුන්ගේ උදහසට ලක්වන විදියේ ක්‍රියා සිදු නො කිරීමට ද වගබලා ගත යුතු ය. යම් උගතකු යමක් පිළිබඳ ව සොයා බලා ඒ පිළිබඳ ව සාධාරණ නිගමන දක්වයි නම් එම මතය පොදු සමාජය පිළිගනු ලබයි. එසේම ජනප්‍රිය පුද්ගලයෙකුගේ ප්‍රකාශය ද යම් වටිනාකමක් දක්වයි.

බුදු හිමියන්ගෙන් බණ අසා ආගම මාරු කරන්නට සැදූ උපාලි ගෘහපතියාට බුදු හිමියන් ප්‍රකාශ කරනු ලැබුවේ ඔබ වැනි ප්‍රසිද්ධ පුද්ගලයකු ඉක්මනින් තම ආගම වෙනස් නො කළ යුතු බවයි.[13] **(අනුවිච්චකාරං)** සමාජයීය බලපෑම නිසා ය. යමක් පිළිබඳ ව වරද නිවරද පිළිබඳ තීරණයකට යාමේදී රටෙහි සිටින වැදගත් බුද්ධිමත් පුරුෂයන්ගේ අදහස් පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු වෙයි. ඥානයේ මිනුම් දඬු තීරණය කිරීමෙහිදී මෙය දක්වා තිබේ.[14] සාළ්හ[15] වැනි සූත්‍ර ධර්මවලදී අවධාරණය කරනු ලබන්නේ ද මෙයයි.

යම් කිසි ක්‍රියාවක් කිරීමේදී එම ක්‍රියාව තමාගේ අහිත පිණිස, දුක පිණිස හේතු වන්නේ දැයි සොයා විමසා බැලිය යුතු බව බුදුසමයේ දක්වයි. අහිත පිණිස (අහිතාය) දුක් පිණිස (දුක්ඛාය) යම් ක්‍රියාවක් පවතිනු ලබන්නේ නම් එබඳු ක්‍රියා නොකළ යුතු වෙයි. එයට හේතුව එම ක්‍රියාව බොහෝ විට වරදක් වන්නට හැකි බැවිනි. මෙසේ අහිත පිණිස හා දුක් පිණිස පවතින්නේ තමාට ම පමණක් ද නැත. එය සලකා බලන ක්‍රමයක් අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රයෙහි දක්වා තිබේ.[16] "මම කයින් යම්කිසි කර්මයක් කරම් ද මාගේ මෙම කාය කර්මය තමාට දුක් පිණිස නො පවතී. අන්‍යයාට දුක් පිණිස නො පවතී. උභය පක්‍ෂයටම දුක් පිණිස නො පවතී. මෙහිදී අදහස් කරනු ලබන්නේ තමන් යම් කිසි ක්‍රියාවක්

57834
ශ්‍රී ලංකා භික්‍ෂු විශ්වවිද්‍යාලය

කිරීමට ප්‍රථමයෙන් තෙවරක් සිතා බැලිය යුතු බවයි. එනම්; තමන් (අත්තබ්‍යාබාධාය) අන්‍යයා (පරබ්‍යාබාධාය) සහ දෙපක්ෂය ම (උභයබ්‍යාබාධාය) පිළිබඳ යි. එසේ අහිත පිණිස දුක් පිණිස පවතින ක්‍රියා වරද ලෙස ද එසේ නො වන ක්‍රියා නිවැරදි ලෙස ද දක්වා තිබේ.

වජ්ජ යන වචනය අර්ථ කිහිපයකින් භාවිතයට ගැනෙන බව පෙනේ.[17]

1. දෝෂාරෝපණයට ලක්වන,
2. මනා පැවැත්මට අහිතකර වූ,
3. දෝස පැවරීමේ අදහසින්,
4. දුරු කළ යුතු දෙය,
5. ආර්ය අෂ්ටාංගික මාර්ගයට බාධාවන,
6. සංසාරයේ රඳවා තබන ආදී වශයෙන් ද සූත්‍රධර්ම න්‍යාය අනුව තේරුම් දිය හැකි ය.

වජ්ජ වන්නේ කෙසේ ද වජ්ජ දේශනාවේ අරමුණ කුමක් ද යනුවෙන් විමසන විට යථොක්ත පිළිතුරු ලැබෙයි. සූත්‍ර හා විනය ඇසුරින් ඒ පිළිබඳ ව සොයා විමසා බැලිය යුතු වෙයි. සාමාන්‍ය වචනයක් සේ පෙනුණ ද වජ්ජ යන වචනය තුළ අරුත් රාශියක් ම දක්නට ඇති බව පෙනේ. ඒවා එකින් එක විවරණය කර බැලිය යුතු ය. එමගින් වජ්ජ දේශනාවේ මූලික අරමුණ පිළිබඳ ව යම් නිගමනවලට පැමිණීමට හැකියාව ලැබේ. සත්වයා භවයෙන් භවය සංසාරයේ සැරි සරන්නේ නිවැරදි මගට පැමිණීමට ඇති නොහැකියාව නිසා ය. මිනිසා එම තත්වයට ඇද දමන කරුණු කාරණ බොහෝ ය.

බුදුසමය පුද්ගලයා සමාජගත සත්වයකු වශයෙන් දකී. පුද්ගලයා දූෂණයට ලක් වූ කල්හි සමාජය ද දූෂණයට ලක් වේ. සමාජය දූෂණය වූ කල්හි පුද්ගලයා දූෂණයට පත්වේ. මෙය සමාජයේ පවත්නා ක්‍රමවේදයයි. අග්ගඤ්ඤ සූත්‍රයෙහි මේ බව දක්වයි.[18139] "යම් තැනැත්තියක් පෙර ස්ත්‍රීව සිටියා ද



ඒ ස්ත්‍රියට ස්ත්‍රීලිංගය පහළ විය. යම් කෙනෙක් පෙර පුරුෂ ව සිටියා ද එම පුරුෂයාට පුරුෂ ලිංගය පහළ විය. ඒ කාලයේ ස්ත්‍රිය ද පුරුෂයා දෙස බොහෝ වේලා බලයි. පුරුෂයා ද ඒ ස්ත්‍රිය දෙස බලයි. බොහෝ වේලා ඔවුනොවුන් දෙස බලන්නාවූ ඒ සත්වයන්ට අධික රාගය පහළ වූයේ ය. රාග පරිදාහයට බැස ගත්තේ ය. ඒ සත්වයෝ පරිදාහ හේතු කොට ගෙන මෙවුන්දම් සේවනය කළෝ ය. ඒ කාලයේ යම් සත්ත්ව කෙනෙක් මෙවුන්දම් සේවනය කරන්නාවූ සත්වයන් දකී ද සමහර කෙනෙක් ඔවුන්ට අළු ගසත් සමහර කෙනෙක් ගොම ගසත් අපිරිසිදු තැනැත්තා නැසේවා, අපිරිසිදු තැනැත්තා නැසේවා සත්වයෙක් කෙසේ නම් සත්වයකු හට මෙබන්දක් කරන්නේ දැයි කියයි.

"සමාජයේ ජීවත් වූ මිනිසුන් අතර සිදු කෙරෙන මෙවුන්දම් සේවනය පවා ප්‍රසිද්ධියේ කිරීම වරදක් ලෙස සලකා තිබේ. එනිසා ම එයට සම්බන්ධ වූ අය සමාජයේ දෝෂාරෝපණයට ලක්විය. එසේ වූයේ ඔවුන් සිදු කරනු ලැබුවේ වරදක් නිසා ය.

මෙසේ ප්‍රසිද්ධ ස්ථානයක ලිංගික වශයෙන් හැසිරීම වරදක් ලෙස වර්තමානයේ වුව ද සලකයි.[19] දණ්ඩ නීති සංග්‍රහයට අනුව එය දඬුවම් ලැබිය හැකි වරදක් වේ. ප්‍රසිද්ධ ස්ථානවල අශෝභන ලෙස හැසිරීම වරදකි. එනම්; දඬුවම් නියම කළ හැකි ය. දණ්ඩනීති සංග්‍රහයේ එන කරුණකට දඬුවම් නියම කිරීම අධිකරණය මගින් සිදු වන්නකි. ඒ සඳහා ක්‍රමික ව සකස් කරනු ලැබූ නීති රාමුවක් තිබිය යුතු වෙයි. නමුත් සමාජය විසින් දඬුවම් දෙනු ලබන අවස්ථාවක එසේ නොවේ. ලේඛනයක දක්නට නොමැති හොඳ නරක පිළිබඳ සංකල්පයක් මිනිසා විසින් වාචික ව පාරම්පරිකව රැගෙන එනු ලබයි. එම සම්මුතිය හෙවත් සම්ප්‍රදා යකඩ කිරීම වරදකි.

සමාජය විසින් සම්මත කරන ලද වරද නිවරද එකී සමාජය තුළ පවතින සම්මතයක් නිසා මිනිසා විසින් එම

සම්මතය ආරක්ෂා කළ යුතු වෙයි. එක මිනිසකු වුව ද එකී සම්මතයන්ට පටහැනිව කටයුතු කරන්නට යාම නිසා එම වරදෙහි ආදීනව ඇතැම් විට සමස්ත සමාජයට ම විඳින්නට සිදු වෙයි. සමාජය මතුනොව ස්වභාව ධර්මය පවා එම වෙනස් අනුව වෙනස් වන බව අධම්මික සූත්‍රයේ දැක්වේ.[20]

"යම් කලෙක රජදරුවෝ අධාර්මික වෙත් ද, එකල රාජ පුරුෂයෝ අධාර්මික වෙති. රාජ පුරුෂයෝ අධාර්මික වූ කල්හි බ්‍රාහ්මණ ගෘහපතියෝ ද අධාර්මික වෙති. බ්‍රාහ්මණ ගෘහපතියන් අධාර්මික වූ කල්හි නියම් ජනපද වාසීහු අධාර්මික වෙති. බ්‍රාහ්මණ නිගම් ජනපද වාසීහු අධාර්මික වූ කල්හි චන්ද්‍රසූර්යයෝ විෂම වෙති. විෂම චන්ද්‍ර සූර්යයන් වැටෙන කළ නක්ෂත්‍රතාරකාදීහු විෂම වෙති. නක්ෂත්‍රතාරකාදීන් විෂම වූ කල දිවා රාත්‍රිය විෂම වෙති. දිවා රාත්‍රිය විෂම වූ කල්හි මාසාර්ධමාසයෝ විෂම ව පවතී. මාසාර්ධමාසයෝ විෂම වූ කල ඍතු විෂම වෙති. ඍතුන් විෂම ව ගිය කල වාතය විෂම ව පවතියි. වාතය විෂම වූ කල දෙවි දේවතාවෝ ප්‍රකෝප වෙති. දෙවි දේවතාවුන් කුපිත වූ කල වැසි නො වැටෙති, වැසි නැති කල්හි ශෂ්‍යයෝ නො වැඩෙති" මෙහිදී පැහැදිලි කරනු ලබන්නේ මිනිසා වරදට යොමු වූ කල ස්වභාව ධර්මය ද වෙනස් වන බවයි. මිනිස්සු අල්ප ආයුෂ ඇතිවීමට ද දුර්වර්ණ වීමට ද බොහෝ ආබාධ ඇතිවීමට ද එය හේතු වේ.

පුද්ගලයාගේ මානසික දුශ්චරිත ස්වභාවය නිසා භෞතික-අභෞතික පරිසරය පවා වෙනස් වේ. මෙයින් පෙනෙන්නේ මානසික සිතුවිලිවල ප්‍රබලකම යි. මෙහි දක්වන්නේ ඉහළ සිට පහල දක්වා සිදුවන වෙනස්කම් ය. රජතුමා අධාර්මික හෙවත් වැරදි සහගත ලෙස කටයුතු කරන්නට යාම නිසා, අනෙක් පිරිස ද එය අනුගමනය කරන්නට යාම ය. රටෙහි ශෂ්‍ය හිඟවීම ද මිනිසාගේ ආයුෂ පිරිහීම ආදී තත්ත්වවලට මුහුණ දෙන්නට සිදු වන්නේ වරද කෙරෙහි නැඹුරු කරන ලද මනසින් කටයුතු කිරීම නිසා ය. සාමාන්‍ය කෙනෙක් කරන වරදක් සහ ප්‍රධානියකු කරන වරදක්



අතර ප්‍රබල වෙනසක් පවතින බව මෙයින් පෙනේ. මෙම තත්ත්වය සමාජ හා පුද්ගල දෝෂාරෝපණයට හේතු වේ.

සිඟාලෝවාද සූත්‍රයේදී[21] මෙලොව යහපත් සමාජ සංස්ථාවක් සකසා ගෙන ජීවත්වන උදාර පුද්ගලයකු කටයුතු කළ යුතු ආකාරය දක්වා තිබෙන කරුණු කීපයකි. එනම්;

1. චතුර්විධ කම්මකිලෙස **(චත්තාරෝ කම්ම කිලේසා)**
2. සතර අගති **(චතූහි ඨානේහි පාපං කම්මං න කරොති)**
3. භොග විනාශ වන දොරටු **(ඡඅපාය මුඛං)**
4. ෂඩ් දිසා නමස්කාරය හෙවත් සමාජ සම්බන්ධතා **(ඡද්දිසා නමස්සිතබ්බා)**
5. සතර සංග්‍රහ වස්තු **(චත්තාරො සංගහා)**

වරදට නැඹුරු වූ පුද්ගලයා වරදින් මිදී අර්ථයෙහි යෙදවීම මෙම දේශනාවේ අරමුණ යි. සූත්‍රයේ ආරම්භයේදීම දක්වන චතුර්විධ කර්ම ක්ලේශ පිළිබඳ ව මාබෝපිටියේ මේධංකර නාහිමියෝ මෙසේ දක්වති.[22]

"මෙහි සතර කෙලෙස් දැක්වූ තැන වාග් ද්වාරයෙන් සිදුවන පාප අතරින් මුසාවාදය පමණක් දැක් වූ නමුත් මුවින් සිදුවන අනෙක් පවු තුන ද එහි ම ඇතුළත් සේ සලකන විට දස අකුසල් අතරින් කායද්වාරයෙන් වන පාණඝාතය, අදත්තාදානය, පරදාර සේවනය යන තුන ද වාග් ද්වාරයෙන් සිදුවන මුසා, පෙහෙසුන්, පරොස්, හිස්බස් සතර ද යන අකුසල සතක් ද එයින් වැළකීමෙන් සිදුවන දස කුසලයෙහි ඇතුළත් කුසල් සතක් ද, අග කොටසෙහි පෙනෙන දක්ෂිණාර්හාදීන්ට කටයුතු අපචායන විධීන්ට සම්බන්ධ දෘෂ්ටි පෙරටු විය යුතු හෙයින් දශ කුසලින් සෙසු සම්මා දෘෂ්ටි හා තත්පරිවාර ධර්ම වූ අනභිජ්ඣා, අව්‍යාපාද දෙක ද නය ගාහ වශයෙන් තත් ප්‍රතිපක්ෂ වූ දශ අකුසල්හි ඇතුළත් අතිලෝභය වූ අභිධ්‍යාව ද වැරදි විශ්වාසය වූ මිථ්‍යා දෘෂ්ටිය ද ප්‍රකාශිත යයි සැලකේ" යනුයි. මෙම අදහස්වලින් පැහැදිලි වන්නේ සිඟාලෝවාද

සූත්‍රදේශනාව මගින් ද මූලික වශයෙන් පුද්ගලයා දශ අකුසලය නමැති වරදින් මුදවා ලන්නට දේශනා කළ එකක් බවත්, දශ අකුසලයෙන් මිදීම ද සමාජ ගත සත්ත්වයකුට අත්‍යාවශ්‍ය ම වූ කාරණයකි. සමාජගත ජීවිතයක් ගත කරන කෙනෙකුගේ මනා පැවැත්ම සකස් වන්නේ කෙබඳු සංවරයකින් සහ යෙදීමකින් ද යන්න සිඟාලෝවාද සූත්‍රයේ කරුණු දක්වා තිබේ. චතුර්විධ කර්ම කිලෙස ලෙස දක්වා තිබෙන්නේ,

1. පාණඝාතයෙන් වෙන්වීම.
2. අදින්නාදානයෙන් වෙන්වීම.
3. මුසාවාදයෙන් වෙන්වීම.
4. පරදාරසේවනයෙන් වෙන්වීම

යන කරුණු ය.[23] බුදුසමය මිත්‍රත්ව ධර්මය මත පිහිටි දර්ශනයකි. වරක් ආනන්ද හිමියන් බුදුරදුන් වෙත පැමිණ බුදුදහමින් හරි අඩක් ම මිත්‍රත්වය මත පදනම් වී ඇතැයි කීහ. එම අවස්ථාවේ බුදුහිමියන් පැහැදිලි කරනු ලැබුවේ හරි අඩක් නොව සම්පූර්ණ බුදුසමය ම මිත්‍රත්වය මත පදනම් වී ඇති බවයි.[24] හිරගෙවල් ඇසුරින් කරන ලද පර්යේෂණවලින් හෙළිවන්නේ ද මිතුරන් නිසා අපරාධවලට යොමු වී ඇති ආකාරයයි. පුද්ගල පැවැත්මට මිතුරන් ගෙන් විශේෂ කාර්යයක් සිදුවෙයි. ආශ්‍රය කරන මිතුරා අනුව වරදට නැඹුරු වන්නන් සහ සුමගට යොමු වන්නන් දැකිය හැකි ය. ඇතැමුන් කොපමණ යහපත් වැඩ හුරු කළත් සමගට යොමු වන්නේ නැත.[25] "ඉවසීම නැමැති ශාන්තිය උතුම් තපස යි. බුදුවරු නිවන උතුම් කොට දේශනා කරති. අනුන් නසන්නා **(පරූපඝාති)** පැවිද්දෙක් නො වේ. අනුන්ට පීඩා කරන්නා **(පරං විහේඨයන්ති)** ශ්‍රමණයෙක් නො වේ."

"අනුන්ට ජාත්‍යාදියෙන් සටා නො බැනීමත්, (අනූපවාදො) අනුන්ට හිංසා නො කිරීමත් (අනූපඝාතො) පාතිමෝක්ෂ සංවරයත්. අහරෙහි පමණ දැන ගැනීමත් (භත්තස්මිං මත්තඤ්ඤුතා ච) ගමින් දුර පිහිටි සෙනසුනෙහි ඇල්මත්, අෂ්ට



සමාපත්තීන්හි යෙදීමත් යන සියලු බුදුවරුන්ගේ අනුශාසනාව යි." වැළකිය යුතු කරුණු මෙන් ම කළ යුතු දේවල් පිළිබඳ ව ද මෙහි අවධානය ලක් කරනු ලැබ තිබේ. සංසාර පැවැත්මට හේතු මා හෙවං ආනන්ද, අවච මාහේවං, සකල මේව ඉදං බ්‍රහ්මචරියං ආනන්ද යදිදං කල්‍යාණ මිත්තා. වන්නා වූ සියලු වැරදි ක්‍රියාවලින් වෙන් වීම අකරණං යනුවෙන් දැක් වේ. සබ්බ යනුවෙන් දක්වන්නේ තිදොරින් වන්නාවූ සියලුම අකුසල් ය. එසේ ම මනසෙහි පහළ වන්නාවූ කෙලෙස් ධර්ම ය.[26] ඒවා දුරු කළ යුත්තේ ඇයි? සංසාරයේ පුද්ගලයා රඳවා තැබීමට ඒවා හේතු වෙයි. කුසල් වැඩි දියුණු කිරීම ය, සිත නීවරණ ධර්මයන්ගෙන් පිරිසිදු කර තැබීම ය, ඉවසීමේ ගුණය ප්‍රගුණ කිරීම ය, අන්‍යයන් නො නැසීම ය. අන්‍යයන්ට පීඩා නො කිරීම, අන්‍යයන්ට දොස් නො නැගීමය, අන්‍යයන්ට හිංසා නො කිරීමත් පාතිමෝක්ෂයේ සංවරවීමකි, ආහාරයෙහි පමණ දැන ගැනීම ය, ඈත් වූ වන සෙනසුන්හි විසීමත් අෂ්ට සමාපත්තීන්හි යෙදීමත් මනසෙහි වැඩිය යුතු ධර්මයෝ ය.

ප්‍රාතිමෝක්ෂ දේශනාවෙහි මූලික අරමුණු කීපයකි. එහි දැක්වෙනුයේ භික්ෂුව සමාජයේ වරදින් තොර පුද්ගලයකු බවට පත් කිරීම ය. භික්ෂුවගේ ඇවතුම් පැවතුම් සහ වරද නිවරද සඳහා මුල් කාලයෙහි පැවතුනේ ඕවාද ප්‍රාතිමෝක්ෂය පමණි. පසුව ශ්‍රාවක ඉල්ලීම මත ආසවට්ඨානිය ධර්ම පහළ වූ කල්හි විනය පනවන ලදී.[27] විනය පැණවීමට හේතු වූ කරුණු කිහිපයකි. දිට්ඨධම්මික වජ්ජයන්ගෙන් සංවර වීම සහ සම්පරායික වජ්ජයන්ගෙන් වැළකීම යන[28] කරුණු පිණිස තථාගතයන් වහන්සේ ශ්‍රාවකයන් හට සිකපද පනවන ලදී.[29] එසේම, සංඝයාගේ සුවිධුතාව සහ පහසුව දුසිල් මහණුන්ට නිග්‍රහය සහ සුසිල් මහණුන්ගේ පහසු විහරණය, වර්තමානයේ ඇතිවන ආශ්‍රවයන්ගෙන් සංවරය සහ පරලොව ආශ්‍රවයන්ගෙන් වැළකීම, ඉහාත්ම වෛරයන්ගෙන් සංවරය පරලොව වෛරයන්ගෙන් වැළකීම, ඉහාත්ම දෝෂයන්ගෙන් සංවර සහ පරලොව දෝෂයන්ගෙන් සංවරය, ඉහාත්මයේ බිය සැලකීම සහ පරලොව වන බිය නැති කිරීම, ඉහාත්මයේ වන

අකුසලයන්ගෙන් සංවරය සහ පරලොවදී වන අකුසලයන්ගෙන් ඈත්වීම ගිහියන්ට අනුකම්පා පිණිස හා පාපිෂ්ඨයන්ගෙන් දුරුවීම පිණිස, අප්‍රසන්නවුන්ගේ ප්‍රසාදය සහ පැහැදුන අයගේ ප්‍රසාදය වැඩි දියුණු වීම, සද්ධර්මයේ චිරස්ථිතිය හා විනයානුග්‍රහය පිණිසයි.

භික්ෂු පාතිමෝක්ෂ පැනවීමේ අරමුණ දෙස බලන විට වරදකරන අය සංවර කිරීම හා මතු සිදුවිය හැකි වරදවලින් පුද්ගලයා ගලවා ගැනීම මුල් වූ බව පෙනේ. කෝධය හා උපනාහය යන ධර්මයෝ සාවද්‍ය ධර්ම ලෙස ද[30] (ද්වේ මේ භික්ඛවේ ධම්මා සාවජ්ජා) අකෝධය සහ අනුපනාහය සහ අනුපනාහය අනවජ්ජ ධර්මය ලෙස ද[31] (ද්වේ මේ භික්ඛබේ ධම්මා අනවජ්ජා) දක්වා තිබේ. හේහසික හා සමාජික වශයෙන් මිනිසා සතු සාවද්‍යතා බොහෝ ය. එම අකුසල ධර්ම දුරු කිරීම වජ්ජ දේශනාව කිරීම සඳහා හේතු වී තිබේ.

පුද්ගලයා වරද කෙරෙහි නැඹුරු කරනු ලබන්නේ අකුසල මූලයන් ය. විවිධ අකුසල ධර්ම ගොඩ නැගෙන්නේ මෙම අකුසල මූල හේතු වෙති.[32] ලෝභය, දෝස, මෝහ අකුසල මූලයෝ වෙති. ලෝභයක් වේද ලෝභ සහගත සිතින් කයින් හෝ වචනයෙන් හෝ මනසින් හෝ යම් ක්‍රියාවක් කරනු ලබන්නේ ද එය අකුසල්ය." පුද්ගලයා සංසාරයේ රඳවා තැබීමට හේතුවන සහ නිර්වාණය පිණිස හේතු නො වන හා බුදුසමයේ උගන්වනු ලබන මුඛ්‍යාර්ථයට පටහැනි සියලු ක්‍රියා වජ්ජ ලෙස සලකා තිබේ. එකී පරමාර්ථයට පටහැනි ප්‍රශ්නයක් විමසූ අවස්ථාවකදී වුව ද බුදු හිමියන් පිළිතුරු ලබා නො දුන්නේ එකී පදනමෙහි පිහිටා ය.[33] බුදුදහමින් ශික්ෂණය නොවූ සාමාන්‍ය පුද්ගලයාගේ ස්වභාවය "අනුන්ගේ සුළු වරද වුව ද ලෙහෙසියෙන් දැකීම ය. ඔහු තමාගේ ලොකු වරද පවා නො දකියි. අනුන්ගේ දොස් දකින්නා ඒ දොස් දහයියාමෙන් පොලා මතුකර දක්වයි. තමාගේ දොස් වූකලී කොළවලින් සිරුර මුවාකර ගන්නා ලිහිණි වැද්දකු මෙන් සඟවා ගනී."[34]
"නිතර අනුන්ගේ දොස් දක්නා ස්වභාව ඇති, අවමන්කොට



කථා කරන සුලු වූ ඒ පුද්ගලයාගේ ආශ්‍රවයෝ වැඩෙත්. ඔහු හත් බවින් ඈත් වෙයි.[35]

මිනිසා තමාගේ වැරදි දකින්නේ නැත, අනුන්ගේ වැරදි වැඩිපුර දකියි, තමන්ගේ වැරදි සඟවා ගනී, අනුන්ගේ වැරදි හුවා දක්වයි. බුදු සමයේ දක්වන්නේ මෙය මිනිසාගේ සාමාන්‍ය ස්වභාවය බව යි. එම තත්ත්වය දැන හඳුනාගෙන ජීවත්වන නිවැරදි පුද්ගලයා සියල්ල මැනවින් අවලෝකනය කරනු ලබයි.

යම් ක්‍රියාවක් නිසා නුවණැති අන් කෙනෙක් නින්දා කෙරෙත් ද එසේ ස්වල්ප වූ හෝ කාය වාග් මනෝ දුශ්චරිතයක් නො කරන්නේ ය.[36] **(නච ඛුද්දං සමාචරේ කිංචියේන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං)** මෙලොව පරිහානියට ලක් වන පරලොව පරිහානියට පත් වන අනුන්ගෙන් නින්දා ලබන ක්‍රියාවක් කරනු ලබයි ද එය සුදුසු ක්‍රියාවක් නො වේ. ඉන් අවැඩක් ම සිදු වන බව බුදුසමයේ අදහස යි. මිනිසා තමා අතින් සිදු වන එබඳු වැරදි මොනවා දැයි සොයා විමසා බලා ඉන් වැළකිය යුතු වෙයි. මෙලොව පරලොව පිරිහීම වැළැක්වීම, මිනිස් බවින් පහළට වැටීම වැළැක්වීම වජ්ජ දේශනාවේ අරමුණ වී තිබේ.

## ආන්තික සටහන්

1. අං. නි. 1, පිට : 336, කාලාම සූත්‍රය

2. අං. නි. 1, පිට : 344, සාළ්හ සුත්තං.

3. ධම්මපද : බාලවග්ග
   තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
   යස්ස පතීතො සුමනො - විපාකං පටිසේවති.

4. ධම්මපද : බාලවග්ග
   නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති
   යස්ස අස්සුමුඛො රොදං - විපාකං පටිසේවති.

5. චන්ද්‍රවිමල හිමි, රේරුකානේ, කෙලෙස් එක්දහස් පන්සියය, පිටː 04

6. පාරාජිකාපාළි, පිටː 100

7. රාහුල හිමි, වල්පොළ, ලක්දිව බුදුසමයේ ඉතිහාසය, පිට 159. ඇම්. ඩී. ගුණසේන – 1993

8. රාහුල හිමි, වල්පොළ, ලක්දිව බුදුසමයේ ඉතිහාසය, පිට 164. ඇම්. ඩී. ගුණසේන – 1993

9. දණ්ඩ නීති සංග්‍රහය.

10. විනය ශික්ෂාපද.

11. දී. නි. 3, පිටː136, අග්ගඤ්ඤ සුත්තං.

12. ම. නි. 1, පිටː 324, අලගද්දූපම සුත්තං.

13. ම. නි. 2, පිටː 60, උපාලි සුත්තං.



14. අං. නි. 1, පිටː 336, කාලාම සුත්තං.

15. අං. නි. 1, පිටː 344, සාළ්හ සුත්තං.

16. ම. නි. 2, පිටː 130, අම්බලට්ඨිකා රාහුලෝවාද සුත්තං.

17. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාළි සිංහල අකාරාදිය, පිටː 426. ඇම්. ඩී. ගුණසේන – 1950

18. දී. නි. 3, පිටː 136, අග්ගඤ්ඤ සුත්තං.

19. දණ්ඩ නීති සංග්‍රහය.

20. අං. නි. 2, පිටː 140, අධම්මික සුත්තං.

21. දී. නි. 3, පිටː 288, සිගාල සුත්තං.

22. මේධංකර හිමි, මාබෝපිටියේ, සිගාලෝවාද සූත්‍රය, පිටː 111.

23. දී. නි.3, පිටː 288, සිගාල සුත්තං.
    පාණාතිපාතො අදින්නාදානං - මුසාවාදො පවුච්චති
    පරදාරගමනඤ්චෙව - නප්පසංසන්ති පණ්ඩිතා

24. බුදුදහමම මිත්‍රත්ත්වයකි.

25. චුල්ලවග්ග පාළි 2, සංඝභේදක ඛන්ධකය, පිටː 298, දේවදත්ත හිමිගේ පංචවරය.

26. චන්ද්‍රවිමල හිමි, රේරුකානේ, කෙලෙස් එක්දහස් පන්සියය, පිටː චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩල -1973

27. පාරාජිකාපාළි, පිටː 21

28. අං. නි. 1, පිටː 192

29. එම,

30. අං. නි. 1, පිටː 192, විනය පෙය්‍යාලං.

31. එම,

32. අං. නි. 1, පිටː 235, රථකාර වග්ගය.

33. ම. නි.2, පිටː 152, චූලමාලුංඛපුත්ත සුත්තං.

34. ධම්මපදය - මළවග්ග.

සුදස්සං වජ්ජමඤ්ඤේසං - අත්තනො පන දුද්දසං
පරේසං සොහිවජ්ජානි - ඕපුණාති යථා භුසං
අත්තනො පන ඡාදෙති - කලිංව කිතවා සඨො

35. ධම්මපදය - මළවග්ග.

පරවජ්ජානුපස්සිස්ස - නිච්චං උජ්ඣාන සඤ්ඤිනො
ආසවා තස්ස වඩ්ඪන්ති - ආරා සොආසවක්ඛයා

36. ඛු. නි. ඛු. පා. පිටː 20, කරණීය මෙත්ත සුත්තං.